**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව 2017**

---

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 7(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සහ 2018 ඔක්තෝබර් 19 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද ගනුදෙනු පිළිබඳ වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1

(i) ප්‍රමිතයේ 132 ඡේදය ප්‍රකාරව, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 108 ඡේදය ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණතෙහි හෝ සටහන් තුළ මුළු අයභාරයේ උපවර්ගීකරණයක් අදාළ අස්ථිත්වයේ මෙහෙයුම්වලට යෝග්‍ය පරිදි වර්ගීකරණය කර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ලෙස ලැබී තිබුණු රු.21,944,000 ක ආදායම වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර ගෘහ භාණ්ඩ හා සවිකිරීම්, කාර්යාල උපකරණ හා පරිගණක උපකරණවලින් සමන්විත සියළුම ජංගම නොවන වත්කම් වාර්ෂිකව සියයට 5 බැගින් ක්ෂය කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායම උපචිත පදනමට ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ වෙනුවට මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.2,107,445 ක් හා සභාවේ නිලධාරීන් හා සේවකයින් 09 දෙනා වෙනුවෙන් පාරිතෝෂික වියදම ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණු රු.232,400 ක Fund Transfer Account නමින් වූ ශේෂය සත්‍යාපනය සඳහා කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළනය කිරීම සඳහා රු.309,000 ක් හා රු.45,000 ක් පිළිවෙලින් මුදල් ශේෂයට එකතුකර හා අඩුකර තිබුණි. එම හඳුනානොගත් ශේෂ පිළිබඳව විස්තර කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා නියාමන සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,466,375 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,240,908 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,707,283 කින් අඩුවී තිබුණි. සෘජුවම බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු ආදායම් මුදල් පදනමට හඳුනාගෙන ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනා නොගැනීම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව වියදම් රු. 5,962,479 කින් වැඩිවී තිබීම ඉහත අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.